මගේ අංකය : 02/06/04/03 RCT 2010.11.

**අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 05/2010**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්

**<u>අනතුරුදායක දැව ඉවත් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ 1996.01.10 දින දරණ හා අංක: 01/96 චක්‍රලේඛය මෙයින් අවලංගු වන අතර, වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ජීවිත හා දේපලවලට අනතුරුදායක රජයේ ඉඩම්වල ඇති ගස් ඉවත් කිරීම රාජ්‍ය දැව සංස්ථාවේ කාර්යභාරයකි. අනතුරුදායක ගස් ඉවත් කිරීම පිලිබඳව රාජ්‍ය දැව සංස්ථාවේ අදාල ප්‍රාදේශීය කළමනාකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව දැනුම් දී දින 30ක් ඇතුලත එම ගස/ගස් ඉවත් කිරීම රාජ්‍ය දැව සංස්ථාව විසින් සිදු කළයුතුය. එසේ කිරීමට සංස්ථාව අපොහොසත් වන විටදී, එනම් දින 30 ක කාලය ඉක්ම ගිය පසු, ඒ බව රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති වෙත දන්වා ඉවත් කළ යුතු බවට හඳුනාගත් ගස/ගස් වෙන්දේසියේ විකිණීම සඳහා මෙයින් ඔබට බලය පවරනු ලැබේ. ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළයුතුය.

1. අවම ලංසුව ස්ථානීය අගය විය යුතුය.
2. වෙන්දේසි සිදු කළයුත්තේ ප්‍රාදේශිය ලේකම්/සහකාර ප්‍රාදේශිය ලේකම් විසින් පමණි.
3. වෙන්දේසි කිරීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දිය යුතු අතර එම දැන්වීම් ප්‍රසිද්ධ කළ බවට ප්‍රාදේශිය ලේකම් විසින් සෑහීමට පත්විය යුතුය.
4. දැව ඉවත් කිරීම සිදුකිරීමට පෙර ඉවත් කරන පුද්ගලයා හෝ ආයතනය, ඉවත් කරන්නේ කුමන ගස් වර්ගද, කොපමණ ප්‍රමාණයෙන්ද, යන්න පිළිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අදාල අඩවි වන කාර්යාලය වෙත හා රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශිය කාර්යාලය වෙත දැනුම් දිය යුතුය.
5. දැව ඉවත් කිරීමේදී ඒ සඳහා දැනට පවතින ක්‍රමවේදය අනුව දැව ප්‍රවාහන බලපත්‍ර ලබාගත යුතුය.
6. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ රජයේ ඉඩම්වල ඇති අනතුරුදායක දැව ඉවත් කිරීම සඳහා පමණි.

7. මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු/පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වන්නේ නම් පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත්) - දුරකථන අංකය: 011-2877287 අමතනු මැනවි.

**ආර් එ- එස් සමරතුංග**
ලේකම්
පරිසර අමාත්‍යාංශය

**පිටපත් :** ලේකම් - දැන ගැනීම පිණිස හා අවශ්‍ය කටයුතු සඳහා
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

වන සංරක්ෂක ජනරාල් - දැන ගැනීම පිණිස
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

සභාපති - දැන ගැනීම හා සුදුසු පරිදි ක්‍රියා කිරීම පිණිස
රාජ්‍ය දැව සංස්ථාව